59324

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**

22 . 11 . 2016

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 8 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................ විභාග අංකය :- ..............................

සැලකිය යුතුයි:

- පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. I, II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

---

- පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

(01) කෘත්‍රිම ආහාර ගැනීමෙන් බොහෝ ලෙඩ රෝග ඇතිවන බව ........................ මගින් සොයාගෙන ඇත.
(1) පර්යේෂණ (2) පර්යේෂන (3) පර්යේශණ (4) පර්යේශන

(02) සාරධර්ම සුරැකීමෙන් ........................ සමාජයක් ගොඩනැගිය හැකි ය.
(1) ධර්මිෂ්ට (2) ධර්මිශ්ට (3) ධර්මිෂ්ඨ (4) ධර්මිශ්ඨ

- පහත සඳහන් එක් එක් වාක්‍යයේ ඉරි ඇඳි කොටසේ අදහස දෙන යෙදුම තෝරන්න.

(03) තම පුතාගේ විදේශ ගමන සිකුරට ම හරියන බව මව විශ්වාස කළා ය.
(1) නිවැරදි ව (2) ස්ථිරව ම
(3) ඉක්මනින් (4) නොවෙනස් ව

(04) රැකියාවට යද්දී සුනිමල් අකරතැබ්බයකට මුහුණ දුන්නේ ය.
(1) විනාශයකට (2) මෝඩකමකට
(3) හිරිහැරයකට (4) කරදරයකට

(05) පහත දැක්වෙන යුගල පද අතරින් මුල් පදයට විරුද්ධ අදහස දෙන යුගල පදය තෝරන්න.
(1) තෑගි බෝග (2) කෙළි සෙල්ලම්
(3) සිරිත් විරිත් (4) වතගොත

(06) මුලින් දී ඇති පදයට විරුද්ධ පදය ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) දුවැන්ත - විශාල (2) නිර්භීත - එඩිතර
(3) ප්‍රවීණ - නිපුණ (4) කීර්තිය - නින්දාව

(07) මුලින් දී ඇති පදයෙහි සමානාර්ථ පමණක් ප්‍රකාශවන පිළිතුර තෝරන්න.
(1) සත්‍ය - අසත්‍ය, බොරු, මුසා (2) සඳ - සිසි, තරිඳු, උළිඳු
(3) දිය - ජලය, දද, ජාතිය (4) සර - විල, වනය, පවන

(08) ''හිවලා'' යන නාම පදයේ නිවැරදි ප්‍රකෘතිය පහත කොටස් අතරින් තෝරන්න.
(1) හිවලුන් (2) හිවල්
(3) හිවලා (4) හිවලු

(09) තද්ධිත නාම ගණයට අයත් නොවන පදය තෝරන්න.
(1) ධාර්මික (2) උදාරතර (3) ගුණවත් (4) පිරිසිදු

(10) කෘදන්ත නාම ගණයට අයත් පිළිතුර තෝරන්න.
(1) බලා - ගොස් (2) නැටුම් - කියමන්
(3) දේශීය - නාගරික (4) පරණ - බරණ

(11) මහාප්‍රාණ අක්ෂරයක් නොමැති පිළිතුර තෝරන්න.
(1) අභිමානය (2) වයෝවෘද්ධ
(3) සුවිශේෂ (4) අධිෂ්ඨානය

(12) සඤ්ඤක අක්ෂර ඇතුළත් වචන යුගලය තෝරන්න.
(1) අමර, වරුණ (2) රබාන, රංචුව
(3) ළපලු, පවන (4) කුඹුර, කරඬුව

(13) ගුණ නාම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ගයන්නා, බලන (2) පියුමි, එරන්දි
(3) මහනුවර, කොළඹ (4) කාරුණික, සුන්දර

(14) යමෙක් කළ ප්‍රකාශයක් ඒ අයුරින් ම උපුටා දැක්වීමේ දී යෙදිය යුතු විරාම ලක්ෂණය වන්නේ,
(1) වරහන (2) දෙතිත
(3) යුගල උඩුකොමා (4) තනි උඩු කොමා

(15) ප්‍රාදේශීය ව්‍යවහාරයේ වගාකර අත්හැර දමූ හේන හැඳින්වෙන්නේ,
(1) නවදැලි හේන නමිනි (2) හේන් කනත්ත නමිනි
(3) කුරුලු පාලුව නමිනි (4) පුරන් හේන නමිනි

(16) මැණිකක එක් පැත්තක ඇති තද වර්ණය
(1) කෝවංගුව යි (2) ඖරලය යි (3) තරාසම යි (4) මලුක්කම යි

(17) පැමිණ, ලියවයි යන ක්‍රියාපද අයත් ක්‍රියාවර්ගය වන්නේ,
(1) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා (4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(18) පහත දී ඇති ප්‍රස්තාව පිරුළු අතරින් ඓතිහාසික ප්‍රවෘත්තියක් සම්බන්ධ ප්‍රස්තාව පිරුළ තෝරන්න.
(1) කබලෙන් ලිපට වැටුණා වගෙයි
(2) ඉඟුරු දී මිරිස් ගත්තා වගෙයි
(3) පිඳුරු ගොඩේ ඉන්න බල්ලා වගෙයි
(4) අශ්වයාට අං ආවා වගෙයි

- ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

(19) (1) ගායිකාවෝ ගී ගයන ලදී.
(2) බැතිමතුන් විසින් දෙවියෝ පුදනු ලබති.
(3) සේවිකාව වැඩ කරනු ලබයි.
(4) ලේඛකයෝ විසින් පොත් ලියනු ලබයි.

(20) (1) නුඹලා හොඳින් වැඩ කළෙහි.
(2) තුරු ලතාවෝ සුළඟට සෙලවෙයි.
(3) මෑණියෝ දරුවන්ට අවවාද දෙති.
(4) ඔවුන් චාරිකාවක් ගියෝය. (ලකුණු 2 X 20 = 40)

## II කොටස

- 1, 2 ප්‍රශ්න අනිවාර්යය වේ. 3, 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

(01) කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස පන්ති කාමරයේ දී ඔබ සකස් කළ පොත් පිංච ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
(1) ඔබ සකස් කළ පොත් පිංචට යෙදූ නම කුමක් ද? (ලකුණු 02)
(2) පොත් පිංච සඳහා කරුණු සපයාගත් මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)
(3) පොත් පිංච සකස් කිරීමේ දී මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 04)
(4) ඔබේ කණ්ඩායම් ක්‍රියාකාරකම නිර්මාණශීලීව නිම කිරීමට යොදාගත් ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 04)
(5) මෙම කණ්ඩායම් ක්‍රියාකාරකමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04)
(මුළු ලකුණු 16)

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150කට නො අඩු රචනයක් ලියන්න.
(1) මාර්ග නීති පිළිපදිමු.
(2) පරිසර දූෂණය අවම කර ගැනීමට කටයුතු කරමු.
(3) සාරධර්ම සුරකිමු.
(4) ජන ක්‍රීඩාවල සංස්කෘතිකමය වටිනාකම.
(5) විද්‍යා ගුරුතුමියගේ මග පෙන්වීම යටතේ ඔබට ළමා නව නිපැයුම් තරගයට ඉදිරිපත්වීමට වාසනාව ලැබුණි. එතැන් සිට නිර්මාණශීලීව කතාව ගොඩ නගන්න. (ලකුණු 14)

(03) බදුල්ල සමන්පුර මහා විද්‍යාලයේ දරුවන් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා ඉතිරි කිරීමේ බැංකු ශාඛාවක් පාසලේ ආරම්භ කිරීමට විදුහල්පතිතුමා අදහස් කර ඇත. ඒ බව දන්වා බදුල්ල ඉතිරිකිරීමේ බැංකුවේ කළමනාකාර මහතාට වාණිජ විද්‍යා සංගමයේ ලේකම් ලියන ලිපිය සකස් කරන්න. (ලකුණු 10)

(04) පෙළ පොතේ පාඩම් ඇසුරෙන් අසා ඇති පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු ලියන්න.
(1) "අලියෙකුටත් වඩා ශක්තිමත් මිනිහෙකු සමහර විට බියගුල්ලෙකු වන්න පුළුවන්"
1. මෙසේ ප්‍රකාශ කළේ කාහට ද?
2. මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(2) "යමු පුතේ, ටවුමට ගිහින් බයිසිකලයක් අරගෙන ඉක්මනට ගෙදර යමු."
1. මෙම ප්‍රකාශ ඇතුළත් පාඩමේ නම කුමක් ද?
2. පුතේ, යනුවෙන් ඇමතුවේ කාහට ද?

(3) "පින්වත, තෙපි ගමනේ විඩා විය. විලට බැස ගිම්නිවා නොනාන්නේත් හැයි ද?"
1. මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?
2. එය උපුටාගත් මුල් ග්‍රන්ථය කුමක් ද?

(4) "අපි එහෙ ගියාම අඩු ගණනේ ගේ වහලා යන්ඩ වෙන්නේ නෑනේ."
1. මෙම ප්‍රකාශය ඇතුළත් සාහිත්‍ය නිර්මාණය ලියූ ලේඛිකාව නම් කරන්න.
2. මෙම ප්‍රකාශ කළේ කවුරුන් හට ද?

(5) ''මොනව ද මේ උඹල දෙන්න බෙල්ල හරව හරවා බලන්නේ''

1. මෙම ප්‍රකාශය ඇතුළත් සාහිත්‍ය නිර්මාණය කුමක් ද?
2. එය ලියූ රචකයා කවුරුන් ද? (ලකුණු 2 X 5 = 10)

(05) පහත සඳහන් ඡේදය කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජන කවිය මෙන්ම අපේ ජන සාහිත්‍යය තුළ තවත් සුවිශේෂී අංගයක් වන්නේ ජන කතා ය. මෙම ජනකතා අතීත මුතුන් මිත්තන්ගේ ජීවන රටා ආශ්‍රිතව පට බැඳුණ කතා ය. එම කතන්දරවලින් අපගේ දැනුම වර්ධනය කර ගත හැකි ය. විනෝදය සඳහා ද ඒවා කියවිය හැකි ය. ඇසිය හැකි ය. ජන කතා අතර හාස්‍ය දනවන ඒවා ද උපදේශාත්මක කතා ද ඇත. සමහර කතාවලින් අනුවණකම් ද ප්‍රකාශ වේ. උදාහරණ වශයෙන් මහදැනමුත්තාගේ කතා වන, වී වැපිරූ සැටි, එළුවාගේ හිසේ හිරකරගත් මුට්ටිය ගැලවීම, ගඟ නිදිද යි බැලීම යනාදි කතා දැක්විය හැකි ය. මෙම කතා තුළින් ද අපේ ජන සාහිත්‍යය පෝෂණය වේ.

(1) සිංහල ජන සාහිත්‍යයේ දැකිය හැකි සාහිත්‍ය අංග දෙක මොනවා ද? (ලකුණු 02)
(2) ජන සාහිත්‍යය තුළින් ලැබිය හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)
(3) මහදැනමුත්තාගේ කතාවලින් විවරණය වන්නේ කුමක් ද? (ලකුණු 02)
(4) එවැනි කතා දෙකක නම් ඡේදයෙන් තෝරා ලියන්න. (ලකුණු 02)
(5) පහත දැක්වෙන වචනවල තේරුම ලියන්න.

(1) හාස්‍ය - ..................................
(2) උපදේශ - .................................. (ලකුණු 02)

(ලකුණු 2 × 5 = 10)

(06) පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

(1) කුමාරතුංග මුනිදාස මහතා ළමයින්ගේ කියවීමේ පුරුද්ද වර්ධනය කිරීමට ලියූ පොත් පෙළ නම් කරන්න.
(2) දළඳා වහන්සේ වැඩ සිටින සුවඳ කුටිය හඳුන්වන විශේෂ නම කුමක් ද?
(3) උම්මග්ග ජාතක කතාව රචනා කළ සාහිත්‍ය යුගය නම් කරන්න.
(4) කොළඹ ග්‍රහලෝකාගාරයේ නිර්මාතෘවරයා කවුරුන් ද?
(5) 'දාසෙන් නිරිඳුට පින් දීපත්තේ' පද්‍ය පන්තිය ලියූ කවියා නම් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

(07) පහත දැක්වෙන කවි පෙළ කියවා ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1.
සොඳින් බැබළි ගජ මුණෙකි පත්මේ
තෙදින් විදුරු චිත්තා නුවණැ ත්මේ
යෙහෙන් නැගුණ මී වාහන යුත්මේ
වඳිමි එගණ දෙව් සිරිපද පත්මේ

2.
සුදු දළ ගජ සොඬ මුණෙකි පත්මේ
සුදු මීමකු නැගෙමින් වැඩ ගත්මේ
සොඳ උමයංගන ඉසුරුගෙ පුත්මේ
වඳිනෙමි ගණදෙවි සිරිපද පත්මේ

22.11.2016 7 ශ්‍රේණිය 59205 සිංහල භාෂාව හා සාහිත්‍ය

3. අකුළාගෙන සොඬ ගජතෙකු වැන්නේ
නෙරවා කන් පෙති සුළු කුළු වැන්නේ
සියොළඟ ගෝමර මල්පෙති වැන්නේ
පින් ඇති ගණදෙවි නුවණක් දෙන්නේ

Learning Resource Center
R
De Mazenod College
Kandana

(1) පැදි පෙළෙන් වර්ණනා කෙරන දෙවියන්ගේ නම ලියන්න.

(2) එම දෙවියන් වැඩ සිටිනා ආසනය කුමක් ද?

(3) කවියා දෙවියන්ගෙන් කරන ඉල්ලීම සඳහන් කරන්න.

(4) මෙහි සඳහන් දෙවියන්ගේ දෙමාපියන් කවුරුන් ද?

(5) පැදි පෙළෙහි ඇතුළත් උපමාවක් හා උපමේයක් ලියන්න. (ලකුණු 2 × 5 = 10)